# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2179/21 - 2020 ජූනි මස 10 වැනි බදාදා - 2020.06.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් අයකළ යුතු බද්දෙහි ප්‍රතිශතය පහත උපලේඛනයේ විස්තර කරන ආකාරයෙන් පනවා 2019 සහ 2020 වර්ෂ සඳහා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොළඹ මහ නගර සභාව 2018.10.29 දිනැතිව සභා සම්මත කර ඇති යෝජනාව, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ඉසුර දේවප්‍රිය වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**ඉසුර දේවප්‍රිය,**
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන
සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2019 අප්‍රේල් මස 18 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ,
පළාත් සභා ගොඩනැඟිල්ලේ දී ය.

1A - PG 4980 - 22 (2020/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

| | කාණ්ඩය | විනෝද කටයුත්තේ ස්වභාවය | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | A | • සිනමා ශාලා | 10% |
| 02 | B | • විදේශීය කලාකරුවන්ගේ සියළු ප්‍රසංග සඳහා, Carnival සැණකෙලි | 10% |
| 03 | C | • වාණිජ පරමාර්ථයෙන් පවත්වනු ලබන දේශීය ශිල්පීන් සහභාගී වන සියළු ප්‍රසංග සඳහා | 10% |
| 04 | D | • දේශීය ශිල්පීන් සහභාගීවන ආහාරපාන රහිතව මිල වන DJ ප්‍රසංග, නැටුම් සංදර්ශන, Sing Alone සහ වෙනත් නැටුම් වැයුම් සහිත ප්‍රසංග<br>• අන්තර් ජාතික ක්‍රීඩා තරඟ<br>• සුබසාධක සංගම්, ආදී ශිෂ්‍ය සංගම් සහ එවැනි සමිති සංවිධාන විසින් පවත්වනු ලබන ප්‍රසංග | 10% |
| 05 | E | • ක්‍රියාත්මක මට්ටමේ පවතින කලාකරුවන්ගේ සංගමයක් මූලිකව පවත්වනු ලබන ප්‍රසංග (වර්ෂයකට උපරිම ප්‍රසංග තුනකි)<br>• දේශීය ක්‍රීඩා තරඟ<br>• දේශීය වේදිකා නාට්‍යය ගීත සහිත ප්‍රසංග | 08% |
| 06 | F | • දැනට ප්‍රසිද්ධ කලාකරුවෙකු විසින් තම ජීවිතයේ විශේෂ අවස්ථාවක් ලෙස පවත්වනු ලබන ප්‍රසංගයක් සඳහා (ජීවිත කාලය තුළ එක් වරක් සඳහා පමණක්)<br>• පාසලක් විසින් පාසලේ සුබසාධනය සඳහා පවත්වනු ලබන අයදුම්කරු විදුහල්පති වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිත ප්‍රසංග<br>• පාසලක් හෝ ආදි ශිෂ්‍ය සංගමයක් හෝ විද්‍යාලයීය සංගමයක්, පාසලක් වෙනුවෙන් පවත්වන ක්‍රීඩා තරඟ හා පාසල් ක්‍රීඩා සංගම් විසින් පවත්වන තරඟාවලි<br>• උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍ය සංගමයක් විසින් ශිෂ්‍ය සුබසාධනය සඳහා පවත්වන ප්‍රසංග | 07% |
| 07 | G | • DINNER DANCE / SING ALONE (ආහාර පාන සමඟ මිල වන රු. 3,000 ට වැඩි ප්‍රවේශපත්) | 07% |
| 08 | H | • දැනට ජීවත්ව සිටින අවු. 75 ඉක්මවූ දැඩිව රෝගාතුරව සිටින ප්‍රවීණ කලාකරුවකු සඳහා වෛද්‍යාධාර පිණිස හෝ ප්‍රවීන කලාකරුවකුගේ අවසාන ප්‍රසංගය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් විනෝද බදු නිදහස් කළ ප්‍රසංගයක් (ජීවිත කාලය තුළ එක් වරක්) | 0% |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.